නමෝ බුද්ධාය

ශ්‍රී සම්බුද්ධ ශාසනික

දාහ නව වෙනි වෙළුම
ආරම්භය: 2001-07-05

මාසික ධර්ම සංග්‍රහය අංක: 189

ශ්‍රී. බු. ව. 2559 | 2016 අප්‍රේල් 21 | බක් කළාපය

# නිවන් ලබන නිසි මග

# පහන් කරන ගුණ ගණ

ගල්කිස්සේ ධර්මපාලාරාමාධිපති, ශ්‍රී ලංකා අමරපුර මහා සංඝසභාවේ
මහා ලේඛකාධිකාරී

**අතිපූජ්‍ය කොටුගොඩ ධම්මාවාස අනුනාහිමිපාණන් වහන්සේ විසිනි**

නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස ///

**කරණීය මත්ථ කුසලේන - යන්තං සන්තං පදං අභිසමෙච්ච**
**සක්කෝ උජූ ච සුජූ ච - සුවචෝචස්ස මුදු අනතිමානී**

පින්වත්නි

අමාමහ නිවන් සම්පත ලබනු කැමති කවර කෙනෙකුන් වුවද ප්‍රථමයෙන් ම ක්‍රියාශීලී දක්ෂ පුද්ගලයෙකු විය යුතුය. එසේම අවංක වූද, අතිශයින් ම අවංක වූ ද සුවච මෘදු මොලෙක් ගති පැවතුම් ඇති නිහතමානී කෙනෙකු ද විය යුතුය. ඉහත සඳහන් ගාථාවේ අදහස එය යි.

කරණීය මෙත්ත සූත්‍රයෙහි ප්‍රථම ගාථාව මෙය යි. මෙම සූත්‍රය දේශනා කළේ භික්ෂූන් වහන්සේ පිරිසකටය. උන්වහන්සේට ඇති වූ අමනුෂ්‍ය උපද්‍රවයක් වළක්වා ගෙන ඒ අමනුෂ්‍යයන්ගේ පිහිට ලබාගෙන තමන් වහන්සේගේ භාවනා දියුණු කර ගැනීම මෙහි ප්‍රමුඛ අරමුණ විය.

මේ සූත්‍රයේ දී තථාගතයන් වහන්සේ පළමුවෙන් ප්‍රතිපත්ති ගරුක ක්‍රමවත් පුද්ගලයෙකු වීමට අවශ්‍ය ගුණාංග දාහතරක් දක්වා තිබේ. එකී කරුණු දාහතර **මෙසේය.**

පිළිවෙත් ගරුක බව, අවංක බව, **වඩාත්** අවංක බව, කීකරු බව, නිහතමානීකම, ලද දෙයින් සතුටුවීම පෝෂණයට අපහසු කෙනෙක් නොවීම, වැඩ කටයුතු බහුල කර නො ගැනීම සැහැල්ලු පැවැත්ම සංසුන් ඉඳුරන් ඇති බව, තැනට ඔබින නුවණ රළු දළ ගොරෝසු ගති නැති බව, කා සමඟ වුවද වැඩි භාජනයට නොයන ගතිය.

මෙම ගුණාංග වලින් තම ජීවිතය සකසාගෙන ඉන් අනතුරුව මෛත්‍රී භාවනාව කළ යුතුය. මෛත්‍රීයෙහි නියම ගුණය ලැබෙන්නේ එවිටයි. අද මෙම දේශනයට ඇතුළත් වන්නේ ඉහත සඳහන් කළ ගාථාවෙහි එන කරුණු හය ගැනය.

නිවන බලාපොරොත්තු වන පුද්ගලයා විසින් සපුරා ගත යුතු පළමු වැනි ගුණාංගය ප්‍රතිපත්ති ගරුක බව යි. නිවනට පැමිණීමට නම් යම් කිසි බුද්ධිමත් බවකින් යුතුව තම ජීවිතය සකස් කර ගත යුතුය.

තමා කරන රැකීරක්ෂාදී කටයුතු ගෙදර දොරේ කටයුතු ද දරු වන්ගේ කටයුතු ආදී සාමාර කටයුත්තකදී වුවද පිළිවෙළක් ඇතුව සැලසුමක් ඇතිව වැඩ කිරීම වැදගත්ය. පැවිදි පක්ෂයේ කෙනෙක් නම් සතර සංවර සීලය නිසි පරිදි පුහුණු කළ යුතුය. එය ගිහියෙකු හෝ වේවා. පැවිද්දකු හෝ වේවා පුද්ගලයාගේ ගුණාත්මක ගුණ ඇතිවීමට හේතු වන්නකි. එවන් ගුණයකින් තොරව කරන බණ භාවනාදියෙන් ප්‍රතිඵල නො ලැබේ. මෙහි පිළිවෙත් ගරුක බව යනුවෙන් ප්‍රථමයෙන් ම දක්වා ඇත්තේ පංච සීලයෙන් යුත් පිරිසිදු පුද්ගලයකු වීමය. එය රහත් බවට පත්වීම දක්වාම ඇති ශීලයෙහි මූලික අත්තිවාරමයි. මෙම අත්තිවාරමෙන් තොරව කවර තරමේ ගිහියෙකුට වුවද පැවිද්දකු වුවද නිවන් මගට යොමු විය හැකි බව ඉඳුරාම කිව යුතුය.

සක්කො ගුණ දක්ෂ බවයි. දක්ෂයා කිසිදු අවස්ථාවක දී වැඩ කටයුතු කල් නො දමයි. ආවාට ගියාට උඩින් පල්ලෙන් කටයුතු කිරීමක් ඔහු තුළ නැත. මෙය ශ්‍රේෂ්ඨතම බෝධිසත්ව ගුණයකි. බුදු බව පතන බෝධිසත්වයන් වහන්සේ තුළ පවත්නා උදාර වූ ගුණය දක්ෂ බවයි. ක්‍රියාශීලී ගුණය දියුණු කර ගැනීමට කුඩා කල සිටම අප හැම දෙනෙක්ම සිතට ගත යුතු ය. එයින් පුද්ගලයා ආර්ථික වශයෙන් බුද්ධිමය වශයෙන් ද ගුණ ධර්ම වශයෙන් ද ඇස්පනාපිට දියුණුවට පත්වීම නිරායාසයෙන්ම සිදු වන්නක් වෙයිනි.

දෙවැනි තුන් වැනි ගුණ දෙක අවංක බව හා අතිශයින් ම අවංක බව ය. කවර කෙනෙකුට වුවද අනුකම් - ආදී සංවිධාගෙන කළ හැකිය. තව කෙනෙකුට නො තේරෙන සේ කළ හැකිය. එහෙත් මේ අවංක පුද්ගලයා එබන්ම අවංක පුද්ගලයා කවදාකවත් කෙතරම් අවස්ථා ලැබුණද වරදක් නොකරයි. එය ඔහුගේ සිරුරට කිසිසේත් ඒකග නොවන බැවිනි. අවංක පුද්ගලයා සැමගේ ප්‍රසාදය ලබයි. එය මෙලොවදීම ලැබෙන ඉෂ්ඨ විපාකයකි. ඔහු මම අවංක ය කියා කියා තව කෙනෙකුට ඇඟවිය යුතු නැත. තව කෙනෙකුට කිය යුතු නැත. ඇසුරු කරන්නන් තුළ පමණක් නොව ඔහු ගැන දන්නා හඳුනන කවර කෙනෙකුන් තුළ වුවද මේ අධ්‍යාත්මික ගුණ නිසා ආකර්ෂණීය ශක්තියක් ඇතිවේ. එදා සුතසෝම රජතුමා අරතරම් දරුණු රාක්ෂයාට අවවාද කළ විට ඔහු වශී වූයේ බෝසත් සුතසෝමයන්ගේ මේ උත්තරීතර ගුණය නිසාය.

වුවද කීකරු බව ය. යටත් පහත් ගති පැවතුම් ඇති බවය. මෙයින් අදහස් කෙරෙන්නේ මවුපියනට ගුරුවරුනට වැඩිහිටියනට ගරු කරන ස්භාවයයි. ආඩම්බර කමින් ඉදිමී ඉහත කී අය පහත් කොට සැලකීම බලා සිටියදී ම පුද්ගලයකු පිරිහීමට හේතුවන මාර්ගයක් බව පැහැදිලි කරුණකි. එබැවින් කීකරු බව උත්කෘෂ්ට ගුණයකි

මෙම ගුණයෙහි ඇති වටිනාකම ගැන තේරුම් නොගත් බොහෝ දෙනා තම මවුපියන් ගුරුවරුන් පවා අඩු වටිනාකමක් ඇති පුද්ගලයන් සේ සලකනු පෙනේ. වයසින් අඩු කෙනෙකුගේ වුවද යහපත් දෙයක් අර්ථවත් දෙයක් කියන්නේ නම් කරන්නේ නම් එයට අවනත වීම අනුකූලතාවය දැක්වීම උදාර ගුණයකි.

මෙම ගාථාවේ එන පස්වැනි ගුණය මෘදු මොළොක් පුද්ගලයකු විය යුතු බවය. ධනය නිසා, දැනුම නිසා, බලය නිසා නැතිනම් වෙන වෙනත් හයි හපන්කම් නිසා ඇතැම් අය දළ ගොරෝසු ගති පැවතුම් වලින් යුක්ත ය. කෙනෙකුට කිට්ටු විය නොහැකි ය. කථා කරන්නේ ද අන් අය නිග්‍රහයට ලක් කරමිනි. කැත්තෙන් පොල්ලෙන් ගහන්නාක් මෙන් කථා බහ කරන පිළිපැදීන ප්‍රියශීලී බවක් වචනයක හෝ බැල්මක හෝ නැති පුද්ගලයා කවර තරමේ කෙනෙකුන් වුවද ඒ ගිහියා - ඒ පැවිද්දා පිළිකුල් කිරීම මිනිස් වර්ගයාගේ පමණක් නොව තිරසන් ගත සතුන්ගේ ද සිරිත යි.

දිනක් බුදුරජාණන් වහන්සේ සැවත්නුවර ජේතවනාරාමයෙහි දුවල් දන් වැළඳීමෙන් අනතුරුව දිවා විහරණය කොට විවේකය සෙවන ඇති ගසක් යට වැඩ සිටියහ. කිට්ටුව පිහිටි සෙල්ලම් පිට්ටනියක ක්‍රීඩා කරමින් සිටි ළමා පිරිසක් ජේතවන පොකුණ වෙතට දිවගෙන අවුත් මුහුණ කට සෝදා ඇති තරම් ජලය පානය කොට භාජන කීපයකින් හැලි - හැලි අපහසුවෙන් වතුර රැගෙන යන අයුරු බුදු රජාණන් වහන්සේ දුටු සේක. උන්වහන්සේ දරුවන්ට කථා කළහ. ඔවුහු එහා බුදුරජාණන් වෙත පැමිණියහ.

"දරුවනි, මේ වතුර ගෙන යන්නේ ඇයි?" බුදුහාමුදුරුවනි, අප සමග තව විශාල පිරිසක් ළමයින් සෙල්ලම් කරනවා. ඒ ළමයි අන්‍ය ආගමික ගැළවෝ, ඔවුන් හින්දු, ජෛන, නිර්ග්‍රන්ථකාදී ආගම් අදහන අය. ඒ නිසා වෙහෙරට එන්න කැමති නෑ අපට බීවා වතුර බී ඒ අයටත් ගෙනෙන්නට කියා. දරුවනි, දිය පොදක් පානය කිරීමට ආගමක් වුවමනා නෑ. ඔය හැලි හැලි අරගෙන යන වතුර ඒ ළමයින්ට බීමට මදි දැන් ඔබ සැමදෙන ගොස් ඒ දරුවන් කැඳවාගෙන විත් ඇති තරම් දිය පානය කොට මුහුණ කට සෝදා ගෙන යන ලෙස ඔවුන්ටත් කරුණාවෙන් කියන්න.

අර දරු පිරිස සතුටෙන් දිවගොස් යහළුවන්ටත් ඒ බව කීහ. ඒ දරුවෝ ද මේ කතාව අසා බලවත් සතුටින් යුතුව ජේතවන පොකුණ වෙත පැමිණ නිසි පරිදි ජලයෙන් ප්‍රයෝජනය ගෙන ආපසු යන ගමන් බුදුරදුන් වැඩ සිටි තැනට පැමිණ උන්වහන්සේට තුති පුදා යාමට සූදානම් වෙත්ම අතිශය මෘදු මොළොක් ලෙස මේ

දරුවනට බුදුපියාණන් වහන්සේ අවවාද කළහ. ඔවුහු එය සිහිනෙකින්වත් නො සිතූ දෙයකි. මේ තරම් ශ්‍රේෂ්ඨ පුද්ගලයෙක්, රාජකීය පුද්ගලයෙක් රජවරුන් සිටුවරුන් සේනාපතිවරුන් ගරු කරන පුද්ගලයෙක්, මේ තරම් ප්‍රියශීලී අයුරින් තමනට කථා කරාවී යයි ඒ දරුවන් කිසිසේත් නොසිතූ දෙයකි. ඒ අන්‍යාගමික දරුවෝ මේ ප්‍රවෘත්තිය නිවෙස් වලට ගොස් තම මව්පියනට ද කියා සිටියෝය. ඒ මවුපියවරු දරුවන් සමග පැමිණ බුදුරදුන් හමුවී කථා බස් කොට නොබෝ දිනකින් බෞද්ධයන් බවට ද පත් වූහ. මේ මෘදු මොලොක් බවෙහි ඉෂ්ඨ විපාකයි.

අනතිමානි යනු නිහතමානි ගුණයයි. ආඩම්බර අහංකාර ගති පැවතුම් වලින් තොර බවයි.

කවර තරාතිරමක පුද්ගලයෙකු වුවද, කොතරම් සුදුසුකම් ඇතත් මේ නිහතමානි ගුණය ඇත්නම් කෙසේ වත් ඔහුට සමාජයේ තැනකට පැමිණිය නොහැකිය. ආඩම්බර නැතිකම් තරම් ජනප්‍රිය වීමේ ගුණයක් තවත් නැති තරම්ය. එතරම් ම එය සෑම දෙනෙකුගේ ම සිත් දිනාගන්නා උත්කෘෂ්ට ගුණයකි. එබැවින් මේ ශ්‍රේෂ්ඨතම ගත පැවතුම් දියුණු කොට ගෙන තම තමන්ගේ ජීවිත සාර්ථක කර ගැනීම සැමගේ යහපත පිණිස හේතු වේ.

කරණීය මෙත්ත සූත්‍රයෙහි එන මේ ප්‍රථම ගාථාවෙන් මෙතෙක් කිය වූ යහපත් ගති පැවතුම් දියුණු කොට ගෙන මෙලොවත් පරලොවත් උසස් බවට පත් කොට ගෙන නිවන කරා යාමට සියල්ලන්ම උත්සුක විය යුතුය.

ඔබ සැමට සම්මා සම්බුදු සරණයි !